3 වන පිටුවෙන් (කකුලෙන් අදින කටවල්)

පැමිණි අය, ඉන්පසු පැරකුම් යුගයක් මවා පෑමට ගොස් මඩ නාගත් සැටි බොහෝ දෙනාට තවමත් අමතකව නැත. මේ සියලු මවාපෑම් බලය ලබා ගෙන ජනතාවට කොකා පෙන්වීමට බව නොදන්නා කෙනෙක් නොමැති තරම්ය. අග මුල සම්බන්ධ කර කථා කිරීමට නොහැකි නායකයෝ දක්ෂ කතිකයෝ නොවෙති. දක්ෂ කථිකයෝ නොවන්නේ දක්ෂ ලෙස සිතීමට නොහැකි නියාවෙනි. එබැවින් පතින්නට පෙර නොසිතන්නෝ මෙන්ම කට ඇරීමට පෙර නොසිතන්නෝද තමන් පය ගසා සිටින පොළව නොහඳුනති. එක් පයක් ඇමරිකාවේත් අනෙක් පය කිලිනොච්චියේ තබා ගෙන සමස්ථ ශ්‍රී ලංකාව ගැන කතා කරනවාට වඩා මුනිවත රැකීම වඩාත් ප්‍රඥාගෝචරය.

දක්ෂ ලෙස සිතීමටත්, දක්ෂ ලෙස කෙනෙකුගේ සිත බැඳගන්නා ආකාරයෙන් කතා කිරීමටත් නොහැකි වන්නේ බොහෝ විට ඇසූ පිරූ තැන් ඇති අය නොවීමත්, වෙනත් චින්තනයක් මත පිහිටා ඊට පරිබාහිර දෙයක් විස්තර කිරීමටත් යාම නිසාය. මීට දිය හැකි හොඳම උදාහරණය යුද්ධ ශිල්පය ගැන අයන්නවත් නොදන්නා මංගල සමරවීර වැනි මන්ත්‍රීවරු මාධ්‍ය ඉදිරියට ගොස් ආරක්ෂක විමසුමක් කිරීමය. සියල්ල අවසානයේ බුද්ධිමත් ජනතාව ඉදිරියේ දිස්වන්නේ, අපේක්ෂාභංගත්වය, ඊර්ෂ්‍යාව සහ පටු අවස්ථාවාදී දේශපාලන න්‍යාය පත්‍රයන් පමණි. අද දේශපාලන පොරපිටිය වනාහී වහසි බස් දොඩවන, මඩ ප්‍රචාර රැව් පිළි රැව් දෙන, ගිරිය පුප්පාගෙන බොරු පොරොන්දු අහසට පිඹින සම්පූර්ණ අවුල් ජාලාවකි.

කෙසේ වෙතත් පැරණි රෝම වාග් විශාරදයෙක් වන ක්වින්ටිලියන් කියා සිටියේ, දක්ෂ කතිකයා යනු කථනය පුහුණුව ලබා ඇති යහපත් මිත්‍රයෙක් බවත්, ඔහු එතරම්ම විශ්වාස කටයුතු බවත්ය. දේශපාලන වේදිකාවලදීත්, මාධ්‍ය සාකච්ඡා වලදීත් බොරුවට කෑ මොර දෙන පක්ෂ විපක්ෂ සියලුම දේශපාලකයින්ට මෙබඳු කියමන් වලින් ගත හැකි පාඩම් කෙතරම්ද? එහෙත් අවාසනාවකට මෙන් අපේ රටේ දේශපාලනඥයන්ගෙන් බහුතරයක් රට ගැන පමණක් නොව තමන් නටන බෙරපද වයන රටවල සිටි අදීන නායකයින්ගෙන්වත් පාඩම් උගෙන ඇති බවක් නොපෙනේ. අපේ රටේ පක්ෂ සහ විපක්ෂ සියලුම දේශපාලනඥයින්ට සුදුසු කමකට ඇති එකම දේ වාචාලකමය. නිහතමානිත්වය, ජාතිමාමකත්වය, අවැසි තැන අවැසි අයට ප්‍රසංසා කිරීම, අගය කිරීම, රටේ සහ ජනතාවගේ තිරසාර සෞභාග්‍ය වෙනුවෙන් ක්‍රියාත්මක වීම වැනි දෑ බොහෝ දේශපාලඥයන්ට ආගන්තුක බව හොඳින් පෙනෙන්නට තිබෙන කාරණයකි.

අවසාන වශයෙන් කිව යුත්තේ ඒබ්‍රහම් ලින්කන් මෙන් අවංකව, සංසුන්ව රට වැසියාට සහ රටට හිතැති සාධාරණ කරුණු පහදා දීම අද දවසේ සියලුම දේශපාලකයන්ගේ වගකීමක් වන බවය. මන්ත්‍රී ආසනය, ඇමතිකම, විපක්ෂ නායක කම, අගමැතිකම හෝ ජනාධිපතිකමට වඩා තමන් සේවය කිරීමට තතනන රට ප්‍රධාන තැනක් ගන්නා බව යමෙකුට නොහැගේ නම් ඔහු හෝ ඇය දේශපාලනය නොකිරීම හෝ දැනට දේශපාලනයේ යෙදී සිටී නම් හැකි ඉක්මණිනින් විශ්‍රාම ගැනීම තමන් ඉපදුණු රටට ඔවුනට කළ හැකි හොඳම සේවය වන්නේය.

අපේ රටට අවශ්‍ය වන්නේ බලයට කුලල් කා නොගන්නා, තනතුරු පසුපස හඹා නොයන අවංකව වැඩ කරන නායකත්වයන් පමණි. ඔවුන් පසු පස යාමට ප්‍රගතිශීලි තරුණ තරුණියෝ එමට සිටිති. ඔවුනට පක්ෂ භේද නැත. ජාති ආගම් භේදද නැත. ඔවුනගේ එකම බලාපොරොත්තුව තමන්ගේ ජීවිත කාලය තුළදීම දියුණු, නිවහල් ඒකීය ශ්‍රී ලංකාවක් දැක ගැනීමේ පරම පවිත්‍ර චේතනාව පමණි.

***සංක්‍රමණිකයාගේ සටහන් මෙවර පළ නොවන බව කරුණාවෙන් සලකන්න***


**WANT TO GET PR...?**

**ඕස්ට්‍රේලියාවේ දී**
**ONSHORE**
**STUDENT - PR**
Have you completed or about to complete your Degree/Diploma?

**ශ්‍රී ලංකාවේ දී**
**OFFSHORE**
**SKILLED MIGRATION**
A Trade Certificate/ Diploma/ Degree or Professional Qualification?
Have 1/3/4/6/7 year(s) experience in a skilled occupation or business?

**OTHER MIGRATION**
*Business Owners & Investors/ Visitors/ Spouse/ Parents/ and all other categories*

**Free Service for Student Migration**
IF YOU HAVE BLOOD RELATIVES IN AUSTRALIA IT IS AN ADVANTAGE
YOU SHOULD BE BELOW 45 YEARS
Good Knowledge of English

**PROFESSIONAL ADVICE TOWARDS POSITIVE RESULTS**

Contact
Hirosh Hemantha Gamage ASA, AAIBF (Snr), MMIA
(Registered Migration Agent No: 0320696)

**AUSTRALIAN MIGRATION SERVICES**
245 (3rd Floor), Dharmapala Mw
Colombo 07
Tel: +94 11 5500 100 / 94 773770202
Fax: +94 11 2697 243

**Multinational Migration Services**
20/215, Betula Avenue, Mill Park
Vic 3082, Australia
Tel: 03 97377384/ 0421155152
Fax: 03 94372803
E-mail: info@multinational.com.au

MIA

For More details or FREE Online Assessment Visit Our Web Site
www.multinational.com.au



Immigration...
We do not just provide Services
We provide Solutions



**Don Susantha Katugampala**
LL.B (Monash)
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
by Law Institute of Victoria
MARN: 9686306

Melbourne:
10, Morrison Place
East Melbourne
Victoria 3002 AUSTRALIA
Tel: 61 3 9650 4557
Interstate Callers: 1300 888 331
Mob: 61 417 851 041

Colombo:
No 1 Ground Floor
Hilton Colombo Residence
(JAIC Hilton Towers)
200 Union Place
Colombo 02 SRI LANKA
Tel: 011 230 06 27
Mob: 94 777 347 670

Dubai:
No 6, Juma Aman Building
Al Nadha Dubai UAE
Tel: 97 142984588
Mob: 97 1506580841

GUSS DESIGN

Email: fairfields.lawyers@bigpond.com

**FAIRFIELDS**
IMMIGRATION LAWYERS - MELBOURNE

LAW INSTITUTE OF VICTORIA
SPECIALIST ACCREDITATION

We Deliver Results.....